විශේෂ නිවේදනය - මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ iii ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය -2021

උක්ත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් පුරප්පාඩු 76ක් සඳහා බඳවා ගැනීමට අදාල මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය නිරෝධායන ඇඳිරිනීතිය ඉවත් කළ වහාම පැවැත්වීමට නියමිතය. එම සම්මුඛ පරීක්ෂණය සඳහා පහත ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු බැවින් එම ලේඛන කඩිනමින් සූදානම් කර තබා ගන්නා ලෙස අදාල අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

(1.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(2.) උප්පැන්න සහතිකය ( රෝහල්වලින් නිකුත් කර ඇති උප්පැන්න සහතික භාර ගනු නොලැබේ.)

(3.) 2021.05.21 දිනට වසර 03 කට පෙර ලබා ගන්නා ලද තාරබර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වෘත්තීය ප්‍රවීණතා බලපත්‍රය ('සී' හා 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී 'පන්තියේ බලපත්‍රක්).

(4.) අයදුම්කරු මනා ඇස් පෙනීමකින් යුක්ත බව තහවුරු කිරීම සඳහා MBBS වෛද්‍යවරයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක්.(සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය වන විට මෙම සහතිකය නිකුත් කර මාස 03ක කාලය ඉක්මවා නොතිබිය යුතුය).

(5.) මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුරට අදාළ පත්වීම් ලිපිය.

(6.) ඔබ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ, සේවය ස්ථිර කර ඇති නිලධාරියෙක් නම් සේවය ස්ථිර කිරීමේ ලිපිය.

(7.) ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන පදිංචිය සනාථ කිරීම පිළිබඳ සහතිකය.( සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය වන විට මෙම සහතිකය නිකුත් කර මාස 06 ක කාලය ඉක්මවා නොතිබිය යුතුය)

(8) ඔබ දැනට දරණ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ PL1/ PL 2/ PL3 කාණ්ඩයේ තනතුර සඳහා, ස්ථිර /අනියම්/ආදේශක පදනමින් බඳවා ගන්නා අවස්ථාවේදී එම තනතුරට අදාළව පැවති බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා පහත පරිදි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

(a) බඳවා ගැනීමේ සුදුසුකම අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නම්,
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනයේ මුල් පිටපත.
{ඔබ දැනට විභාග ප්‍රතිඵල ලේඛන ලබාගෙන නොමැති නම් මාර්ගගත ක්‍රමයට(online) කඩිනමින් ප්‍රතිඵල ලේඛන ලබා ගත යුතු අතර ඒ පිළිබඳ තොරතුරු https://certificate.doenets.lk/assets/docs/One_Day_Certificate_Sinhala.pdf සබැඳිය මගින් ශ්‍රී.ලං.විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් (https://certificate.doenets.lk/) ලබා ගත හැකිය}. පාසලේ විදුහල්පති විසින් නිකුත් කරනු ලබන සහතික පිළිගනු නොළැබේ.

(b) බඳවා ගැනීමේ සුදුසුකම 08ශ්‍රේණිය/ 09 වසර සමත්ව තිබීම හෝ ඊට අඩු සුදුසුකමක් නම් පාසල් ශිෂ්‍ය කාර්ය දර්ශකය සහ ඔබ අවසන් වරට අධ්‍යාපනය ලැබූ පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් සහතික කරන ලද ශිෂ්‍ය කාර්ය දර්ශකයේ පිටපතක්.